# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,215— 1960 ඔක්තෝබර් 21 වැනි සිකුරාද — 21.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (II) වැනි ඡේදය–පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු, ඇබෑර්තු ... ... | 777 | තොටුපල් ඊජන්ද හා වෙනත් ඊජන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 779 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 779 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 783 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 785 | විවිධ දැන්වීම් ... ... ... | 786 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කර්ෂ සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නව ප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතා සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු නැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරිහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසුව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූලව ආදී ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

5. **අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම, ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නාවූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදෑතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරි තනතුරු

ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරි තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් දීමනාවන් හා සේවය පිළිබඳ කොන්දේසි.**—මේ තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 1,980න් පටන් ගෙන වර්ෂයකට රු. 120 සහ 180 බැගින් වැඩිවී රු. 4,620 තෙක් නගී. රජයේ රෙගුලාසි අනුව ජීවන වියදම් හා ගෙවල් කුලී ගෙවනු ඇත.

3. **අයදුම්කරුවන්ට තිබිය යුතු අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—අයදුම්කරුවෝ වයස අවුරුදු 25ටත් 35ටත් අතර ලාංකිකයන් විය යුත්තාහ.

අයදුම්කරුවෝ—

(1) (අ) ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සාමාර්ථය ලැබ පහත සඳහන් සුදුසුකම් වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ ඇත්තවුන් විය යුතුයි.

(ආ) (i) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් ඇතිව බිම් මැණීම සහ මට්ටම් පිළිබඳව සර්වේයර් ජනරාල්ගේ අවසර පත්‍රය.

(ii) පහත සඳහන් එකක් ඇතුළු වූ ලංකා කාර්මික විද්‍යාලයේ අනුමත කරන ලද පාඨ මාලාවක් අයදුම්කරු සම්පූර්ණ කරන ලද බවට සහතිකය.

(අ) ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් ඇතිව ගොඩනැගිලි තැනීම i සහ ii හා මට්ටම් ගැනීම i සහ ii.

(ආ) ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් ඇතිව නාගරික හෝ ගොඩනැංවීම් ඉංජිනේරු සහතිකය.

(iii) ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් ඇතුව ප්‍ර. වැ. දෙ. උප පරීක්ෂක ශ්‍රේණියට පත්වීමේ දෙපාර්තමේන්තු විභාගයෙන් සාමාර්ථය හෝ ඊට සමාන විභාගයකින් සාමාර්ථය.

(2) මෙම දෙපාර්තමේන්තුවේ රු. 1,860—120—3,780 වැටුප් ක්‍රමය යටතේ තාවකාලික වැඩ පරීක්ෂක තනතුරක අවුරුදු 2කට නොඅඩු පළපුරුද්දක් ඇති කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලත් අයගෙන් ද ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. මෙම අයදුම්කරුවන්ට වයස් සීමාව බලපවත්වන්නේ නැත.

4. **සේවය පිළිබඳ කොන්දේසි.**—මෙම පත්වීම අවුරුදු 3ක පරීක්ෂණාත්මක කාලයකට යටත් ය.

(අ) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් තනතුරුවලට පත් කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ මෝටර් වාහන සපයා ගත යුත්තාහ. රජයේ මුදල් රෙගුලාසිය අනුව ඔවුන්ට ගමන් ගාස්තු ගෙවනු ලැබේ.

(ඇ) තෝරාගනු ලැබූ අයදුම්කරුවෝ රු. 2,000ක ඇපයක් තැබීමට සූදානම් විය යුත්තාහ.

(ඈ) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම පිණිස දැනට පණවා ඇති නීති හා මින්මතු පණවන නීති වලටද විශේෂයෙන් 1956 අංක 33 දරණ රජයේ භාෂා පණතේ සඳහන් විධි විධාන ක්‍රියාත්මක කිරීමේ නීතිවලටද තෝරාගනු ලැබූ අපේක්ෂකයන් බැඳී සිටිය යුතුවේ.

5. තම චරිතය පිළිබඳව මෑතදී ලබාගත් සහතික පත්‍ර දෙකක පිටපත් අයදුම් පත සමග ඉදිරිපත් කළ යුතුය.

6. මෙයට යාකර ඇති නියමිත ෆෝර්මය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම් පත් 1960 නොවැම්බර් මස 4 වැනි දිනට හෝ ඊට පෙර හෝ " ඉඩම් කොමසාරිස්, තැ. පෙ. 500, කොළඹ " යන ලිපිනයට එවිය යුතුය.

7. අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදයේ මුල පළවූද, රාජ්‍ය සේවාවේ තනතුරුවලට කරන පත්වීම්වලට අදාලවූ ද පොදු කොන්දේසි බලන ලෙස ඉල්ලුම් කෙරේ.

එච්. සී. ගුණවර්ධන,
ඉඩම් කොමසාරිස්.

1960 ඔක්තෝබර් මස 7 වැනි දින,
කොළඹ දීය.

## ආකෘති පත්‍රය

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### ගොවි ජනපදයන්හි හා ගැමියන් පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි සංවර්ධන වැඩ අධිකාරි තනතුරු

1. සම්පූර්ණ නම, ජාතිය හා ලිපිනය :————.

2. * උපන් දිනය හා උපන් ස්ථානය :————.

(අ) අයදුම්කරුගේ (උප්පැන්න සහතිකයෙන් පිටපතක් සමග) :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශවයේ මුත්තාගේ :————.

(ඈ) අයදුම්කරුගේ පිය ප්‍රාර්ශවයේ මී මුත්තාගේ : ————.

---

* අයදුම්කරු ලංකාවෙහි ඉපදුනි නම් (අ) සමග (ආ) හෝ (ඇ) හා (ඈ) දෙකම හෝ පිරවිය යුතුයි. අයදුම්කරු ලංකාවෙහි නොඉපදුනි නම් (අ), (ආ) හෝ (ඇ) හෝ (ඈ) හා (ඈ) දෙකම පිරවිය යුතුය.

3. අධ්‍යාපනික සුදුසුකම් (සමර්ථවූ දින සහිතව) :————.

4. පාසැලින් අස්වූ දින සිට කරන ලද රක්ෂාවන් පිළිබඳ සම්පූර්ණ විස්තර සහ දැනට ලැබෙන වේතනය සහ වැටුප් ක්‍රමය : ————.

5. ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ පිළිබඳ පළපුරුද්ද :————.

6. යුද්ධ සේවයේ යෙදී සිටියේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

7. අමුණා ඇති සහතිකවල ගණන :————.

8. අයදුම්කරුගේ චරිතය පිළිබඳ දැනීමක් ඇත්තවුන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා ඔවුන්ගේ තනතුරුත් : ————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය ————.

10-505

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ඞී. ද සිල්වා මහතා 1960 අගෝස්තු මාසයේදී ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා පවත්වනලද ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ බැව් නිවේදනය කරමි.

ජී. එම්. උදලාගම මහතා 1960 අගෝස්තු මාසයේදී ගම්බද උසාවි සභාපතිවරුන් සඳහා පවත්වන ලද ද්විතීය කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්වූ බැව් මෙයින් නිවේදනය කරමි.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් 13 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ 12.

10-518

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව

**1960 දෙසැම්බර් මස 1 දින සිට 1961 සැප්තැම්බර් මස 30 දින දක්වා මහනුවර (බෝගම්බර සහ මහනුවර රිමාණ්ඩ්) බන්ධනාගාරවලට කෑම ද්‍රව්‍ය සැපයීම**

මහනුවර (බෝගම්බර බන්ධනාගාරය සහ මහනුවර රිමාණ්ඩ් බන්ධනාගාරය) බන්ධනාගාරවලට වර්ෂ 1960 දෙසැම්බර් මස 1 වෙනි දින සිට 1961 සැප්තැම්බර් මස 30 වැනි දින් දක්වා පහත දැක්වෙන කෑම ද්‍රව්‍ය සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් (ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.) පමණක් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර් පෝර්මයෙහි "බී" උපලේඛනය යටතේ දැක්වෙන පරිදි සැපයිය යුතු ආහාර ද්‍රව්‍ය නම් හරක් මස්, එළු මස්, ලිවර්, කුකුළු මස් සහ බිත්තර යනුයි. උපලේඛනයෙහි සඳහන් සියළුම ආහාර ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර්කරුවන් විසින් මිල ගණන් දැක්විය යුතුයි.

3. කොළඹ 9, බේස්ලයින් පාරේ පිහිටි බන්ධනාගාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත් නියමිත ටෙන්ඩර් පෝර්මවල ලියා ටෙන්ඩර් එවිය යුතුයි. නියමිත පෝර්මයේ ලියා නැති ටෙන්ඩර් පත්‍ර භාර ගනු නො ලැබේ.

4. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව ලියුම් කවරයක දමා සීල් තබා කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නො එවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවා විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ කොළඹ 7. කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ඩබ්ලිව්. ජී. හඳගම මහතාට භාර දී එය ලැබුණු බවට ලියවිල්ලක් ලබා ගත යුතුයි.

6. ටෙන්ඩර් පත්‍ර බහාලූ කවරයේ වම් පැත්තේ උඩ කෙළවරේ "මහනුවර බන්ධනාගාරවලට "බී" උපලේඛනය යටතේ ආහාර ද්‍රව්‍ය සැපයීම" කියා ලියා 1960 නොවැම්බර් මස 14 වෙනි දින පෙරවරු 10.30ට ප්‍රථම කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාට ලැබෙන සේ එවිය යුතුයි. එදින පෙරවරු 10.35ට කොළඹ 7, ටොරින්ටන් පෙදෙසේ පිහිටි කර්මාන්ත, ස්වදේශ සහ සංස්කෘතික කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ඉඩ දෙනු ලැබේ.

7. ටෙන්ඩර් භාර ගැනීම නැවැත් වූ දින සිට මාස 3ක් යනතුරු ටෙන්ඩර්කරුවන් තම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන කිරීමට ඉඩ දිය යුතු බව දැන ගත යුතුයි.

8. ටෙන්ඩර්වල සියළුම වෙනස් කිරීම් සහ මැකීම්වලට ටෙන්ඩර් කරු විසින් තමගේ කෙටි අත්සන යෙදිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍ර සඳහා වූ රුපියල් 100ක් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ කච්චේරියක කොළඹ කච්චේරිය හැර තැන්පත් කොට එම කුවිතාන්සිය, ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය. යමෙකුට ටෙන්ඩරය පිළිගත් බව ලියමනකින් දැන්වීමෙන් දින 10ක් ඇතුළත කොන්ත්‍රාත්තුවකට හෝ පොරොන්දුවකට බැඳීමට හෝ අවශ්‍ය ඇප මුදල ඉදිරිපත් කිරීමට හෝ නුපුළුවන් විනිනම් හෝ අනුමත කළ ඇප මුදල වූ රු. 200 (දෙසීය) ඉදිරිපත් කිරීමට නුපුළුවන් විනිනම් හෝ එසේ කිරීමෙන් වැළැකී සිටි නම්, තැන්පත් කරන ලද මුදල රාජසන්තක වෙනවාත් සමගම රජය සම්බන්ධ කවර කොන්ත්‍රාත්තුවකට හෝ බැඳීමට නොහැකිවන සේ ඔහුගේ නම කොන්ත්‍රාත් කඩ කරන්නන්ගේ නාම ලේඛනයට ඇතුළත් කරනවා ඇත. තවද, කොන්ත්‍රාත්තුව කඩ කිරීමේ අලාභ වශයෙන් රු. 2,500ක් (දෙදහස් පන්සියයක්) රජය වෙනුවෙන් යබන්ධනගාර කොමසාරිස්වරයාට ගෙවීමට එම ටෙන්ඩර් කරුවාට සිදුවෙනවා ඇත. මෙම අලාභ මුදල නීති මගින් අය කර ගැනීමේ බලය බන්ධනාගාර කොමසාරිස් වෙත පැවරී ඇත. ටෙන්ඩරය බාර ගත් බව දන්වන නිවේදනය ටෙන්ඩර්කරු විසින් දෙන ලද ලිපිනයට තැපෑලෙන් යවනු ලැබුවහොත් නැතිනම් එහි ගෙන ගොස් බාර දුනහොත් එම නිවේදනය ලැබුණු ලෙස සලකනු ලැබේ. අන්‍ය සියළු තැන්පත් මුදල් කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු ආපසු දෙනු ලැබේ.

10. ඉදිරිපත් කරන මිල ගණන් ඉලක්කමින් මෙන්ම වචනයෙන් ද සඳහන් කළ යුතු බවත් එසේම, එම ගණන් වචනයෙන් සඳහන් නො වන ටෙන්ඩර් ප්‍රතික්ෂේප විය හැකි බවත් දන්වනු ලැබේ.

11. ටෙන්ඩර් පිළිගැනීමෙන් පසු එසේ පිළිගනු ලැබූ ටෙන්ඩර්කරු එම කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කරන වගට ඔහු වෙනුවෙන් ඇප කරුවන් වශයෙන් පෙනී සිටීමට කැමැති වග කිවයුතු පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය.

12. කොන්ත්‍රාත්තුව මැනැවින් ඉටු කරන බවට සුදුසු ඇපකරුවන් පොරොන්දු පත්‍රයකින් බැඳීම අවශ්‍යය. තැන්පත් කළ යුතු අවශ්‍ය ඇප මුදල් ප්‍රමාණයන් මෙහි 9 වැනි වගන්තියේ ප්‍රකාරය. අවශ්‍ය සියලු තොරතුරු මෙහි 3 වැනි වගන්තියේ සඳහන් කාර්යාලයෙන් ලබාගත හැක.

13. එම ටෙන්ඩරය සඳහා ඇති සියලුම කොන්දේසි සම්පූර්ණයෙන් ඉටු වී නොමැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ගැන සළකා බලනු නො ලැබේ.

14. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියලුම ටෙන්ඩර් හෝ සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමේ හා ඕනෑම ටෙන්ඩරයක් කොටස් වශයෙන් පිළි ගැනීමේ අයිතිවාසිකම් මුළුමනින්ම ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

15. ටෙන්ඩර් මණ්ඩලයේ අවසරය නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ අතුරු බදු වශයෙන් දීම හෝ කළ නො හැක. කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් කොන්ත්‍රාත්තුව ඉටු කිරීමේ අයිතිය වෙන කෙනෙකු වෙත පවරමින් දෙන ලද ඇටෝර්නි බලය පිළි නො ගෙන ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුය.

16. මහනුවර බන්ධනාගාර අධිකාරීට සෑහෙන තරම් කරුණු තිබේ නම් කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලබන යමෙකු ගැන තම විරුද්ධත්වය ලියවිල්ලකින් දැනුම් දිය හැක. එවැනි කිසිම කෙනෙකු කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නො යෙදවිය යුතුය. කොන්ත්‍රාත්කරුවන් විසින් වැඩෙහි යෙදවිය යුත්තේ ලාංකිකයන් පමණකි.

17. මීට ප්‍රථම රජයේ කොන්ත්‍රාත්තුවක් භාර නොගත් ටෙන්ඩර් කරුවෙක්, ටෙන්ඩර් පත්‍ර ඉල්ලා සිටීමේදී තම සම්පූර්ණ නම, ස්ථිර ලිපිනය, තමන්ට අයිති ඉඩකඩම් දේපොළ ආදිය පිහිටි දිස්ත්‍රික්කය හෝ කොට්ඨාශය සඳහන් කොට, තමා පදිංචි පළාතේ ආදායම් පාලක තැන විසින් සහතික කරන ලද රපෝර්තුවක් එවිය යුතුය. දේපොළ විස්තරද සඳහන් කළ යුතුය.

මීට ප්‍රථම මෙම දෙපාර්තමේන්තුව වෙනුවෙන් කොන්ත්‍රාත්තු ඉටු කරන ලද කොන්ත්‍රාත්කරුවන්, එසේ කොන්ත්‍රාත් කරන ලද්දේ දැනට ටෙන්ඩර් කැඳවනු ලබන දිස්ත්‍රික්කය සඳහා නොවේ නම්, ඒ ඒ පළාත් හෝ දිස්ත්‍රික්ක හෝ සඳහන් කළ යුතුය.

8. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවාවූද දේ වල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර් කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩ කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය, යන්නයි.

13. 1934රේ 19 වැනි අංකය දරන කම්කරු වන්දි ආඥාපණත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. කොන්ත්‍රාත්කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසුයයි කල්පනා කරනු ලබන යම් කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත් කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේයයි පෙනියන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරණ සියලුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සථිර ඒවා විය යුතුයි.

18. වැඩි විස්තර හම්බන්තොට කෘෂිකර්ම කායසීලයේ කෘෂිකර්ම ව්‍යාප්ත නිලධාරී තැනගෙන් දැනගත හැක.

ඒ. වී. රිචඩ්ස්,
කෘෂිකර්ම අධ්‍යක්ෂක.

1960 ඔක්තෝබර් 12 දින,
පේරාදෙනිය.

## සැපයිය යුතු ද්‍රව්‍ය

### ඉරු දෙකකින් යුත් පොල් අතු සැපයීම

| | |
|---|---|
| බටහත රජයේ ගොවිපොළට | 15,000ක් |
| අම්බලන්තොට රජයේ වී ගොවිපොළට | 5,000ක් |
| හම්බන්තොට කපු පර්යේෂණ මධ්‍යස්ථානයට | 5,000ක් |
| වීරවිල කපුබීජ මධ්‍යස්ථානයට | 15,000ක් |
| තිස්ස රජයේ වී ගොවිපොළට | 200ක් |
| වීරවිල (ට්‍රැක්ටර්) යාංත්‍රික අංශයට | 1,250ක් |

### නම්බෑපු නූණු සැපයීමට

| | | |
|---|---|---|
| හම්බන්තොට කපු පර්යේෂණ මධ්‍යස්ථානයට | බුසල් | 10 ක් |

10-506

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ජී. අයි ටැංකි සැපයීම

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ විසින් ගේජ් 14 ගැල්වනයිස් තහඩු වලින් සෑදූ ජොයින්ට් රිවේට් කිරීමෙන් පසු ගැල්වනයිස් කරනු ලැබුවා වූ ගැලුම් 400ක් අල්ලන (වෘතාකාර මෑන්හෝල් සහ කවරයක් මතුපිට විය යුතුයි.) ටැංකි 30ක් සැපයීම සඳහා ටෙන්ඩර් නොවැම්බර් මස 14 වෙනි දින පෙරවරු 11 තෙක් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් වල සඳහන් කළ යුත්තේ කිරුළපනේ පිහිටි දෙපාර්තමේන්තුවේ බඩු ගබඩාවට භාරදිය හැකි මිළය. සඳහන් කරන මිළ ගණන් පසුව වෙනස් නොකරන සථිර මිළ විය යුතුය. ටෙන්ඩර් පත්‍ර විසඳීමට භාජනය කිරීම සඳහා, අන්තිමට භාර ගන්නා දින සිට සති 4 ක් ඇතුළතදී ටෙන්ඩර් පත්‍ර ඉල්ලා අස්කර නොගත යුතුයි. දැනට ලඟ තිබෙන කොගයකින් සැපයීමට නොහැකි නම් ඉක්මණින් සැපයිය හැකි දිනය සඳහන් කළ යුතුය.

3. 1960 නොවැම්බර් මස 9 වෙනි දින දාවල් 12 දක්වා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය. මෙම කාර්යාලයේ හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිත්තාන්සියක් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුය.

4. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම සීල් තබා "ජී. අයි. ටැංකි සැපයීම" යනුවෙන් කවරයේ වම්පස උඩ කෙළවරේ සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන, එච්ලන් චතුරශ්‍රය, මීකාළඹ 1, යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය කවරයේ වම්පස පහත කෙළවරේ සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට හෝ ටෙන්ඩර් කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් ගෙනැවිත් එච්ලන් චතුරශ්‍රයේ පිහිටි ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි තැනට භාරදී කුවිතාන්සියක් ලබාගත යුතුය.

5. 1960 නොවැම්බර් මස 14 වෙනි දින පස්වරු 2.30 ට ඉහත කී ගණකාධිකාරී තැනගේ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. අවශ්‍ය නම් ටෙන්ඩර් කරුවන්ට ඒ අවස්ථාවේදී පැමිණ සිටිය හැක.

6. යම් කොන්ත්‍රාත් කරුවකු තෝරා ගැනීමෙන් පසු අවශ්‍ය ටැංකි සැපයීමට අසමත් වුවහොත් හෝ පැහැර හැරිය හොත්, තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ කිසිම කොන්ත්‍රාත්තුවකට සම්බන්ධ කර නොගන්නාවූ කොන්දේසි කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛණයට ඇතුළත් කරනු ලැබේ.

7. අවශ්‍ය ප්‍රමාණය සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් පමණක් මිළයට ගැනීමේ හෝ මුළුමණින්ම ප්‍රතික්ෂෙප කිරීමේ බලයද, නුසුදුසු අන්දමේ ඒවා ප්‍රතික්ෂෙප කිරීමේ බලයද දෙපාර්තමේන්තුව සතුය.

සී. ද ෆොන්සේකා,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1,
1960 ඔක්තෝබර් මස 11 වෙනි දින දීය.

10-400

---

## තැපැල් සහ විදුලි සන්දේශ දෙපාර්තමේන්තුව

### අගල් කැපීම සහ යලි ඒවා පිරවීම

පහත සඳහන් ස්ථානයන්හි අගල් කැපීම සහ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් නළ දමනු ලැබීමෙන් පසු ඒ අගල් යලි පිරවීම සඳහාත් 1960 නොවැම්බර් 16 වෙනි දින දක්වා කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සන්දේශ ඉන්ජිනේරු තැන විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1. රීජන්ට් වීථිය—කින්සි පාර මංසන්ධියේ සිට කින්සි පාර දිගේ වෝඩ් පෙදෙස—කින්සි පාර මංසන්ධිය දක්වා යාර 900ක් පමණ දුර ප්‍රමාණය.
2. වෝඩ් පෙදෙස—කින්සි පාර මංසන්ධියේ සිට කින්සි පාර සහ කාසල් වීථිය දිගේ මොඩල් fපාම් පාර—කාසල් වීථිය මංසන්ධිය දක්වා යාර 1,300ක් පමණ දුර ප්‍රමාණය.
3. මොඩල් fපාම් පාර දිගේ, ගොල්f්ප් ක්‍රීඩාංගනය හරහා යාර 500ක් පමණ දුර ප්‍රමාණය.

කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ මැලිග්‍රාf්ප් කැෂියර් වෙත හෝ, පිට පළාත්වල නම් තැපැල් ස්ථානාධිපති වෙත හෝ රුපියල් 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර, කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සන්දේශ ඉන්ජිනේරු තැනගෙන් ලබාගත් පෝර්ම වල ටැන්ඩර පත්‍ර (අනු පිටපතක් සහිතව) ඉදිරිපත් කළ යුතුයි.

1960 නොවැම්බර් 15 වෙනි දින ප.ව. 4 දක්වා ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර නිකුත් කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කිරීම සඳහා පොරොන්දු පත්‍රයකට අත්සන් ගැනීමට ඇපකරුවන් දෙදෙනකු තම වියදමින් ඉදිරිපත් කරන ලෙස තෝරගත් ටැන්ඩර්කරුට නියම කරනු ලැබේ. කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීමේ පොරොන්දුවක් වශයෙන් ටැන්ඩරයේ වටිනා කමින් සියයට 5කට සමාන වන මුදලක් පෝස්ට් මාස්ටර් ජනරාල් වෙත තැන්පත් කරන ලෙස තෝරාගත් ටැන්ඩර්කරුට නියම කරනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුවට බැඳෙන විට එම ගිවිසුම් පත්‍රයට, මුද්දර ආඥා පනත යටතේ මුද්දර ගැසීමට ටැන්ඩර්කරු බැඳී සිටී.

මේ සඳහා ඉදිරිපත් කරන සියලුම ටැන්ඩර් පත්‍ර ඒවා භාරගත් දින සිට අඩු වශයෙන් දින 15ක් වලංගු විය යුතුය.

1960 නොවැම්බර් 16 වෙනි දින පෙරවරු 10ට ප්‍රධාන විදුලි සන්දේශ කාර්යාලයේදී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. මේ අවස්ථාවේදී ටැන්ඩර්කරුවන්ට එහි පැමිණ සිටිය හැකිය.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට් මාස්ටර් ජනරාල්.

1960 ඔක්තෝබර් මස 12 වැනි දින,
ප්‍රධාන තැපැල් කාර්යාලය, කොළඹ.

10-556

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**කිරිල්ලපොනේ, නුගගහවත්ත නිවාස ක්‍රමය සඳහා පාරවල් තැනීම**

1960. 9.2 දින දරණ ගැසට් පත්‍රයෙහි 1960. 8. 24 දාතමින් පළවූ ඉහත සඳහන් දැන්වීම සම්බන්ධයෙන් ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය 1960 නොවැම්බර් මස 4 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තෙක් දීර්ඝ කර ඇත.

1960 නොවැම්බර් මස 2 වෙනි බදාදා පස්වරු 3 වන තුරු මුදල් තැන්පත් කර ටෙන්ඩර් පත්‍ර ලබා ගත හැක.

ධම්සේන ජයනෙත්ති,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544,
කොළඹ 2,
1960 ඔක්තෝබර් මස 15 වෙනි දින.

10-569.

## ලංකා ගමනාගමන මණ්ඩලය

(පැන්සලෙන් ලියූ කල) දෙපැත්තේම ලියවෙන කාබන් කරදසි ය, කොපිං පැන්සල් ය, පාට පැන්සල් ය යන මේවා සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 වේ දෙසැම්බර් මස 7 වෙනි දා වන බදාදා පෙ. ව. 10 වනතෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින් ද යුක්තකොට එවිය යුතුයි. ඒ පෝරම කොළ කොළඹ බාරලැක් ගමුවේ චේර පාර වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් 1960 වේ දෙසැම්බර් මස 6 වෙනි දා වන අඟහරුවාදා දවල් 12 වනතෙක් ලබාගත හැකිය. ඒවා දෙන්නේ කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කාර්යාලයෙහි රුපියල් 100 ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඒ වෙනුවෙන් ලැබුණ කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කාර්යාලයෙන් වැඩි විස්තර දතගත හැකිය.

සී. අයි. එඩ්වඩ්ස්,
ලංකා ගමනාගමන මණ්ඩලයේ
වැඩබලන ලේකම් තැන.

1960. 10. 21.

10-509

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

දෙම්පේ ආරෝග්‍යශාලාවට ඇඳන් 24කින් යුත් වාට්ටුවක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 නොවැම්බර් මස 16 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ටොරිංටන් චතුරශ්‍රයේ උතුරු කොළඹ, ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 නොවැම්බර් මස 4 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 70,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට, (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන; නිදසුනක්: "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති; සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්මේන්තුවේ ප්‍රධාන කායාීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. පේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

1960 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දී ය.

10-555/1

යෝජිත සාත්තු සේවිකා නිවාස උණ පිළිබඳ ආරෝග්‍යශාලාව, අංගොඩ සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 නොවැම්බර් මස 16 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාන ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 නොවැම්බර් මස 4 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 1,35,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක්, ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන; නිදසුනක්: "වෙනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්";
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති; සහ
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්මේන්තුවේ ප්‍රධාන කායාීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. පේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

1960 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දී ය.

10-555/2

කෝපෙයි ග්‍රාමීය ආරෝග්‍යශාලාවට මිනී කාමරයක් සහ කරත්ත මඩුවක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 නොවැම්බර් මස 9 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 නොවැම්බර් මස 4 වෙනි සිකුරාදා පස් වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 13,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

1960 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දී ය.

10-555/3

---

මහ ඉලුප්පල්ලම පර්යේෂණ ගොවිපලේ කාණු ක්‍රමයේ අතිරේක වැඩ සහ සංවර්ධනය කිරීම් සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වෂී 1960 නොවැම්බර් මස 9 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මරදන්කඩවල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිට පතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලා ගැනීමට පුළුවන.

3. වෂී 1960 නොවැම්බර් මස 4 වෙනි සිකුරාදා පස් වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 30,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 50ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්" ;

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධක සමිති ; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායභීලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක
වෙනුවට.

1960 ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දී ය.

10—555/4

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## රාජකීය ලංකා නාවික හමුදාව

### සැප්තැම්බර් මාසයේ ටෙන්ඩර් සම්බන්ධයෙන් ගන්නා ලද අවසාන තීරණ

(1) දියතලාවේ නාවික හමුදාවට එලවළු සහ පලතුරු සැපයීම—
ලැබුණු ටෙන්ඩර් ගණන : (6) හයයි.
තෝරාගත් ටෙන්ඩර්කරු : ඩබ්ලිව්. ජානිස් අප්පුහාමි මහතා.

**පිළිගත් ගණන්**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අර්තාපල් | ... | ... රාත්තලක් | ... | 0 33 |
| බතල | ... | ... එම | ... | 0 9 |
| රටඑළු | ... | ... එම | ... | 0 27 |
| රතුඑළු | ... | ... එම | ... | 0 25 |
| පොල් ගෙඩියක් | ... | ... | ... | 0 19 |
| දෙහි | ... | ... රාත්තලක් | ... | 0 37 |
| කරපිංච | ... | ... එම | ... | 0 25 |
| අමු ඉඟුරු | ... | ... එම | ... | 0 25 |
| ගෙඩිගෝවා | ... | ... එම | ... | 0 38 |
| කොලගෝවා | ... | ... එම | ... | 0 38 |
| ටර්නිප් | ... | ... එම | ... | 0 15 |
| බීට්රූට් | ... | ... එම | ... | 0 38 |
| ලීක්ස් | ... | ... එම | ... | 0 38 |
| රාබු | ... | ... එම | ... | 0 12 |
| සලාදකොල | ... | ... එම | ... | 0 20 |
| පාර්ස්ලි | ... | ... එම | ... | 0 20 |
| සැල්දිරි | ... | ... එම | ... | 0 20 |
| මිංචි | ... | ... එම | ... | 0 10 |
| අළුකෙසෙල් | ... | ... එම | ... | 0 24 |
| බන්ඩක්කා | ... | ... එම | ... | 0 32 |
| බටර් බෝංචි | ... | ... එම | ... | 0 40 |
| මුරුංගා සහ කොලබෝංචි | | ... එම | ... | 0 38 |
| වම්බටු | ... | ... එම | ... | 0 23 |
| පිපිංඤ | ... | ... එම | ... | 0 15 |
| ගැටපොලොස් | ... | ... එම | ... | 0 10 |
| නිවිති | ... | ... එම | ... | 0 15 |
| ඒනුකොළ | ... | ... එම | ... | 0 28 |
| මුකුණුවැන්න | ... | ... එම | ... | 0 17 |
| මාළුමිරිස් | ... | ... එම | ... | 0 50 |
| කැරට් | ... | ... එම | ... | 0 38 |
| නෝකෝල් | ... | ... එම | ... | 0 18 |
| අමුමිරිස් | ... | ... එම | ... | 0 30 |
| වට්ටක්කා | ... | ... එම | ... | 0 10 |
| පතෝල | ... | ... එම | ... | 0 28 |
| දියලබු | ... | ... එම | ... | 0 10 |
| කරවිල | ... | ... එම | ... | 0 30 |
| තක්කාලි | ... | ... එම | ... | 0 50 |
| කිරිඅල | ... | ... එම | ... | 0 20 |
| ඉන්නල | ... | ... එම | ... | 0 20 |
| දෙහිඅල | ... | ... එම | ... | 0 20 |
| මුරුංගා | ... | ... එම | ... | 0 32 |
| වැටකොළු | ... | ... එම | ... | 0 20 |
| රටදෙල් | ... | ... එම | ... | 0 20 |
| කොහිල අල | ... | ... එම | ... | 0 20 |
| කොහිල දළු | ... | ... එම | ... | 0 20 |
| කංකුං | ... | ... එම | ... | 0 12 |
| කතුරුමුරුංගා | ... | ... එම | ... | 0 10 |
| තම්පලා | ... | ... එම | ... | 0 10 |
| සාරන | ... | ... එම | ... | 0 10 |
| ගොටුකොළ | ... | ... එම | ... | 0 35 |
| දොඩම් | ... | ... එම | ... | 0 25 |
| කෙසෙල්ගෙඩි (ඇඹුල්) | | ... එම | ... | 0 25 |
| කෙසෙල්ගෙඩි (කෝලිකුට්ටු) | | ... එම | ... | 0 70 |
| කෙසෙල්ගෙඩි (ආනමාළු) | | ... එම | ... | 0 28 |
| ගස්ලබු | ... | ... | ... | 0 25 |
| අන්නාසි | ... | ... | ... | 0 25 |
| අඹ | ... | ... රාත්තලක් | ... | 0 35 |
| ඇපල් ගෙඩියක් | ... | ... | ... | 2 00 |

(2) දියතලාවේ නාවික හමුදවට මස්, මාළු ආදිය සැපයීම.

ලැබුණු ටෙන්ඩර් ගණන : (3) තුනයි.

තෝරාගත් ටෙන්ඩර් කරු : ඒ. එස්. ආරුමුගම් මහතා.

පිළිගත් ගණන්

| | | රු. | ශ. |
|---|---|---|---|
| මස් (කටු සහිත) | රාත්තලක් | 0 | 70 |
| මස් (කටු රහිත) | එම | 1 | 0 |
| මස් ලිංගුස් | එම | 2 | 50 |
| පිගුදු | එම | 2 | 50 |
| හදවත | එම | 1 | 25 |
| වකුගඩුව | එම | 1 | 25 |
| බොකු (ශුද්ධකළ) | එම | 0 | 60 |
| එළුමස් (කටුරහිත) | එම | 2 | 75 |
| එළුමස් (කටුසහිත) | එම | 2 | 50 |
| ඌරුමස් | එම | 1 | 50 |
| බේකන් | එම | 4 | 50 |
| කුකුළු මස් | එම | 2 | 50 |
| කිකිළි බිත්තර | එකක් | 0 | 28 |
| **මාළු—** | | | |
| තෝර මාළු | රාත්තලක් | 2 | 50 |
| පරවා | එම | 1 | 60 |
| තලපත් | එම | 1 | 25 |
| කොඩුවා | එම | 1 | 30 |
| ගල්මාළු | එම | 1 | 30 |
| බලයා | එම | 1 | 30 |
| අංජිලා | එම | 1 | 50 |
| කෙලවල්ලා (ශුද්ධකළ) | එම | 1 | 60 |
| කුම්බිලා (ශුද්ධනොකළ) | එම | 1 | 10 |
| ඉස්සන් | එම | 1 | 50 |
| **කරවල—** | | | |
| කට්ටා | රාත්තලක් | 1 | 30 |
| කොඩුවා | එම | 1 | 25 |
| තෝරා | එම | 1 | 60 |
| කුම්බිලා | එම | 1 | 0 |
| හාල්මැස්සන් | එම | 1 | 10 |
| ඉස්සන් (පොතු අරිනලද) | එම | 1 | 60 |

(3) සේවය :—කාරියනගර්හි නාවික හමුදවට එලවළු සහ පලතුරු සැපයීම

ලැබුණු ටෙන්ඩර් ගණන : (4) හතරයි.

තෝරාගත් ටෙන්ඩර්කරු : ඒ. එස්. ආරුමුගම් මහතා.

පිළිගත් ගණන්

| | | රු. | ශ. |
|---|---|---|---|
| අර්තාපල් | රාත්තලක් | 0 | 35 |
| බතල | එම | 0 | 10 |
| මංඤොක්කා | එම | 0 | 35 |
| රාජඅල | එම | 0 | 60 |
| කිරි අල | එම | 0 | 20 |
| කරනායි | එම | 0 | 25 |
| රටළූනු | එම | 0 | 35 |
| රතුළූනු | එම | 0 | 30 |
| පොල් ගෙඩියක් | | 0 | 20 |
| දෙහි | රාත්තලක් | 0 | 50 |
| කරපිංචා | එම | 0 | 25 |
| අමුමිරිස් | එම | 0 | 70 |
| අමු ඉඟුරු | එම | 1 | 0 |
| ගෙඩිගෝවා | එම | 0 | 75 |
| කොළ ගෝවා | එම | 0 | 65 |
| කැරට් | එම | 0 | 60 |
| කක්කාලි | එම | 0 | 60 |
| බීට්රූට් | එම | 0 | 60 |
| රාබු | එම | 0 | 30 |
| ලීක්ස් | එම | 0 | 40 |
| සලාදකොල | එම | 0 | 40 |
| නෝකෝල් | එම | 0 | 25 |
| පිපිංඤ්ඤා | එම | 0 | 35 |
| මුරුංගා සහ කොල බෝංචි | එම | 0 | 90 |
| බටර් බෝංචි | එම | 0 | 60 |
| රටදෙල් | එම | 0 | 30 |
| වන්බටු | එම | 0 | 40 |
| අළුකෙසෙල් | එම | 0 | 40 |
| ඉන්නල | එම | 0 | 10 |
| බන්ඩක්කා | එම | 0 | 50 |
| මුරුංගා | එම | 0 | 60 |
| මැකරල් | එම | 0 | 50 |
| වට්ටක්කා | එම | 0 | 25 |
| දියලබු | රාත්තලක් | 0 | 10 |
| කරිවිල | එම | 0 | 60 |
| පතෝල | එම | 0 | 50 |
| මාළු මිරිස් | එම | 0 | 80 |
| නිවිති | එම | 0 | 40 |
| මුකුණු වැන්න | එම | 0 | 15 |
| මූලකීර | එම | 0 | 20 |
| අරකීර | එම | 0 | 50 |
| සාරන | එම | 0 | 40 |
| ළූනුකොළ | එම | 0 | 50 |
| වැටකොළු | එම | 0 | 15 |
| සැල්දිරි | එම | 0 | 70 |
| පාර්ස්ලි | එම | 1 | 40 |
| මිංචි | එම | 1 | 50 |
| කෙසෙල්ගෙඩි (ඇඹුල්) | එම | 0 | 35 |
| කෙසෙල්ගෙඩි (ආනමාළු) | එම | 0 | 40 |
| කෙසෙල්ගෙඩි (කෝලිකුට්ටු) | එම | 0 | 60 |
| දෙඩම් | එම | 0 | 45 |
| ගස්ලබු | එම | 0 | 50 |
| අන්නාසි | එම | 0 | 50 |
| අඹ (යාපනේ හෝ බෙට්ටි) | රාත්තලක් | 0 | 50 |

(4) සේවය :—ත්‍රිකුණාමලයේ නාවික හමුදවට කුළුබඩු, ටින්කෑම ආදිය සැපයීම.

ලැබුණ ටෙන්ඩර් ගණන : (6) හයයි.

තෝරාගත් ටෙන්ඩර්කරු : ඒ. එස්. එම්. ජෙගනාදන් සහ සමාගම.

| | | රු. | ශ. |
|---|---|---|---|
| බටර් (පිටරට) | රාත්තලක් | 2 | 70 |
| බටර් (මෙරට) | එම | — | |
| එළකිරි | පයින්ට් | 0 | 90 |
| වියලි මිරිස් | රාත්තලක් | 1 | 46 |
| වියලිමිරිස් කුඩු | එම | 1 | 0 |
| **කුළුබඩු—** | | | |
| සුදුදුරු | එම | 1 | 10 |
| සුදුදුරු කුඩු | එම | 1 | 50 |
| කොත්තමල්ලි | එම | 0 | 45 |
| කොත්තමල්ලි කුඩු | එම | 0 | 80 |
| කුරුඳු | එම | 2 | 0 |
| කරාබුනැටි | එම | 3 | 0 |
| කරදමුංගු | එම | 8 | 0 |
| උළුහාල් | එම | 0 | 45 |
| සුදුළූනු | එම | 0 | 90 |
| අබ | එම | 0 | 75 |
| සියඹලා | එම | 0 | 25 |
| කහකුඩු | එම | 0 | 80 |
| කහ | එම | 0 | 55 |
| ගම්මිරිස් | එම | 2 | 90 |
| මහදුරු | එම | 0 | 20 |
| මහදුරු කුඩු | එම | 1 | 0 |
| සාදික්කා | එම | 3 | 0 |
| කෑමටගන්නා සූපතෙල් | බෝතලයක් | 1 | 60 |
| කෑමට සුදුසු පොල්තෙල් | එම | 0 | 85 |
| මයිසූර් පරිප්පු | රාත්තලක් | 0 | 60 |
| මුංඇට | එම | 0 | 32 |
| ගොරක | එම | 0 | 35 |
| ඇමෙරිකානු හෝ ඕස්ට්‍රේලියානු පිටි | එම | 0 | 26 |
| සුදුසීනි | එම | 0 | 65 |
| රතුසීනි | එම | 0 | 56 |
| ලුණු | එම | 0 | 6 |
| මේස ලුණු | එම පැකට් | 0 | 35 |
| තේ, බී.ඕ.පී. | එම | 0 | 4 |
| **සිල්ලර බඩු—** | | | |
| ඇමන්ස් | රාත්තලක් | 9 | 0 |
| සෙමලිනා | එම | — | |
| විස්කෝත්තු (පිටරට) | එම | 7 | 25 |
| විස්කෝත්තු (මෙරට) | එම | 2 | 25 |
| බේකින් පවුඩර් | රාත්තලේ ටින් | 2 | 0 |
| කෝන් ප්ලේක් | එම | 1 | 85 |
| වීට් ප්ලේක් | එම | 2 | 0 |
| කෝන් ප්ලවර් | රාත්තලක් | 1 | 75 |
| ටින් බටර් | ටින්එකක් | 2 | 75 |
| ස්පැගටි | එම | 1 | 0 |
| මැකරෝනි | රාත්තලක් | 1 | 65 |
| කේජු | ටින් එකක් | 2 | 50 |
| ටින් අඹ | එම | — | |

| සිල්ලර බඩු— | | | රු. ශ. |
|---|---|---|---|
| ටින් අන්නාසි | ... | ... ටින් එකක් ... | 1 15 |
| ටින් පෙයාස් | ... | ... එම ... | 3 50 |
| ටින් පීච්ස් | ... | ... එම ... | 3 50 |
| කජු | ... | ... රාත්තලක් ... | 3 0 |
| රටඉඳි | ... | ... එම ... | 0 30 |
| ඇටනැති වියලි මිදි ... | | ... එම ... | 2 25 |
| සුල්තානා | ... | ... එම ... | 1 40 |
| කුඩා වියලි මිදි | ... | ... එම ... | 1 20 |
| කුඩාවියලි මිදි ඇටසහිත | | ... එම ... | 1 40 |
| චොකලට් | ... | ... එම ... | — |
| ගෝල්ඩන් සිරප් | ... | ... රා. 2 ටින් ... | 3 90 |
| ගෝල්ඩන් සිරප් | ... | ... රා. 1 ටින් ... | 2 0 |
| ජෑම් | ... | ... ටින් එකක් ... | 0 90 |
| මාමලේඩ් | ... | ... එම ... | 2 0 |
| මාර්ජරීන් | ... | ... එම ... | 2 0 |
| මාර්මයිට් | ... | ... බෝතලයක්... | 2 15 |
| බව්රිල් | ... | ... එම ... | 2 75 |
| ටින්කිරි | ... | ... ටින් එකක් ... | 0 85 |
| කව්ලැක් | ... | ... එම ... | — |
| නෙස්ප්‍රෙ | ... | ... එම ... | 3 15 |
| නෙස්ටමෝල්ට් | ... | ... එම ... | 2 65 |
| හෝර්ලික්ස් | ... | ... බෝතලයක්... | 2 90 |
| එව්රිඩේ | ... | ... ටින් එකක් ... | 1 90 |
| ඕට්මීල් | ... | ... රාත්තලක් ... | 2 10 |
| ගම්මිරිස් | ... | ... බෝතලයක්... | 0 90 |
| අච්චාරු පිටරට | ... | ... එම ... | 3 0 |
| අච්චාරු මෙරට | ... | ... එම ... | 1 75 |
| වූස්ටර් සෝස් | ... | ... එම ... | 1 20 |
| මේනස් සෝස් | ... | ... එම ... | 2 75 |
| තක්කාලි සෝස් | ... | ... එම ... | 2 75 |
| සාඩින් | ... | ... ටින් එකක් ... | 1 15 |
| හෙරිංස් | ... | ... ටින් එකක් ... | 1 40 |
| සැමන් | ... | ... ටින් එකක් ... | 2 75 |
| මැකරල් | ... | ... එම ... | 1 5 |

| සිල්ලර බඩු | | | රු. ශ. |
|---|---|---|---|
| එලවළු තෙල් | ... | ... රාත්තලක් ... | 1 10 |
| ටින් බෝංචි | ... | ... ටින් එකක් ... | 1 65 |
| ටින් පීස් | ... | ... එම ... | 1 65 |
| සුරුවම්කල ඉඟුරු ... | | ... රාත්තලක් ... | 2 50 |
| ජෙලටින් | ... | ... පැකට් එකක් | 1 75 |
| ජෙලි ක්‍රිස්ටල් | ... | ... එම ... | 1 25 |
| හකුරු | ... | ... ... | 3 0 |
| නූඩ්ල්ස් | ... | ... පැකට් එකක් | 1 0 |
| ඔවල්ටින් | ... | ... ටින් එකක් ... | 3 0 |
| පෲන් | ... | ... රාත්තලක් ... | 3 50 |
| සව්හාල් | ... | ... එම ... | 0 35 |
| විනාකිරි | ... | ... බෝතලයක්... | 0 60 |
| වැනිලා | ... | ... එම ... | 0 90 |
| කොචිනීල් | ... | ... එම ... | 0 90 |
| කෝන්බීෆ් | ... | ... ටින් එකක් ... | 2 25 |
| බීෆ් සොසේජ් | ... | ... එම ... | 2 85 |
| පෝක් සොසේජ් | ... | ... එම ... | 2 85 |
| කෝන් මටන් | ... | ... එම ... | 2 25 |
| ඔරේන්ජ් කොඩියල් | | ... බෝතලයක්... | 3 75 |
| පපඩම් | ... | ... රාත්තලක් | 0 85 |
| කෝපි කුඩු | ... | ... එම ... | 2 75 |
| අබ කුඩු | ... | ... ටින් එකක් ... | 3 0 |
| චෙරි | ... | ... රාත්තලක් ... | 5 0 |

ජී. ආර්. ඇම්. ද මැල්,
රියර් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුද මූලස්ථානය,
කොඩි ගහ වීදිය,
කොළඹ 1.
1960 ඔක්තෝබර් මස 10 වැනි දින.

10–462

---

## ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 සැප්තැම්බර් මස පිළිගන්නා ලද ටෙන්ඩර් පිළිබඳ විස්තර

| අංකය | වැඩ විස්තරය | ටෙන්ඩර්කරුවන්ගේ නම් | අඩුම ටෙන්ඩරකරුගේ නම | පිළිගත් අඩුම ටෙන්ඩර්කරුගේ ගණන රු. ශ. | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1. | ගල් අමුන ව්‍යාපාරයේ 1වෙනි කොටසේ ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම | 1. ඒ. ඇම්. අබේරත්න සහ සමාගම<br>2. ඩබ්ලිව්. සමරදිවාකර<br>3. විල්මට් සහ විලියම් සමාගම<br>4. එම්. බී. රණතුංග | ඒ. ඇම්. අබේරත්න සහ සමාගම | 10,451 30 ... | — |
| 2. | ගල් අමුන ව්‍යාපාරයේ 3වෙනි කොටසේ ද්විත්ව කම්කරු නිවාසයක් සෑදීම | 1. ඒ. එම්. අබේරත්න සහ සමාගම ...<br>2. ඩබ්ලිව්. සමරදිවාකර | ඒ. එම්. අබේරත්න සහ සමාගම ... | 10,022 20 ... | — |
| 3. | ගල් අමුන ව්‍යාපාරයේ 3වෙනි කොටසේ නිර්මාන සෑදීම | 1. ඩබ්ලිව්. ඇම්. කළුබණ්ඩා | ඩබ්ලිව්. ඇම්. කළු බණ්ඩා ... | 5,610 0 ... | එකම ටෙන්ඩර්කරු |
| 4. | මින්නේරිය කන්තලේ යෝධ ඇල ව්‍යාපාරය මින්නේරියේ ඕවර්සියර් නිවාස යක් සෑදීම | 1. ඒ. ඇම්. අබේරත්න සහ සමාගම<br>2. විල්මට් සහ විලියම් | ඒ. එම්. අබේරත්න සහ සමාගම | 15,565 0 ... | — |

ම. ටී. බ්ලොක්,
ඊශාන කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන.

ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය,
පොළොන්නරුව, 1960.9.30 වෙනි දින දීය.

10–415

---

## බඩු බාහිරාදිය විකිණීම

### කැලෑ දෙපාර්තමේන්තුව

සණ අඩි 400 ක් ඇති ඉරාපු ලී ගොඩවල් 28 ක් ද, තේක්ක සහ හල්මිල්ල විදුලි බල කණු 80 ක් ඇති ගොඩවල් 20 ක් ද, තේක්ක වටකණු 400 ක් ඇති ගොඩවල් 10 ක් ද, ඝණ අඩි 200 ක් ඇති කොටන් 15 ක් ද 1960 ඔක්තෝබර් මස 27 වැනි ගුරු දින පෙරවරු 9 ට බූස්සේ පිහිටි කැලෑ දෙපාර්තමේන්තුවේ ලී ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා බූස්සේ විශෙෂ වන ආරක්ෂක ගෙන් විමසන්න.

කැලෑ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 509,
කොළඹ 2.

ජේ. ඇල්. ඊ. ප්‍රනාන්දු,
වන සංරක්ෂක.

10—532.

## පාවිච්චියට ගත නොහැකි ද්‍රව්‍ය වෙන්දේසියක්

පාවිච්චියට ගත නොහැකි, බයිසිකලයක්, කැරකැවෙන පුටු දෙකක් සහ තවත් ද්‍රව්‍ය 1960. 10. 29 වැනි දින පස්වරු 1 ට කොළඹ, (ගෝල් ෆේස් කෝට්හි 52 වැනි කාමරයේ) වාණිජ, වෙළඳ, ආහාර හා නැව් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

10–479

## භාරගනු නොලැබූ සහ අමතකව දමාගිය බඩු වෙන්දේසියක්

1960 නොවැම්බර් මස 1 වෙනි අඟහරුවාද ප. ව. 1 ට කොළඹ, නැතිවූ බඩු පිළිබඳ කාර්යාලයේදී (ප්‍රවාහණ අධිකාරි තැනගේ කාර්යාලයේ යට තට්ටුවේදී) අමතකව දමා ගොස් අයිතිවාසිකම් ඉදිරි

පත් නොකරන ලද බඩු බාහිරාදිය වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය පවත්වනු ලබන දින එකී ස්ථානයේදී පෙ. ව. 10.30 සිට බඩු බාහිරාදිය බලත හැක.

බී. ඩී. රම්පාල,
දුම්රිය සාමාන්‍යාධිකාරි තැන.

තැ. පෙ. 355,
කොළඹ, 1960. 9. 30.

10—377

---

## දැන්වීමයි

පාවිච්චියට ගත හැකි පරණ තුවක්කු තොගයක් 1960. 11.2 වෙනි දින පෙරවරු 10 ට මෙම කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම වෙන්දේසියේදී තුවක්කු ඉල්ලුම් කළ හැක්කේ තුවක්කුවක් ගැනීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇති අයට පමණකි. පිළිගනු ලැබූ ලන්සුවක් වෙනුවෙන් නියමිත මුදල වහාම ගෙවිය යුතු ය.

ඩබ්ලිව්. පතිරණ,
කලුතර දිස්ත්‍රික්කයේ දිසාපති.

1960 ක්වූ ඔක්තෝම්බර් මස 11 වෙනි දින,
කලුතර කච්චේරියේදීය.

10-481

---

# විවිධ දැන්වීම්

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### නිවාස සඳහා ඉල්ලුම් පත්‍ර—බටදූව නිවාස යෝජනා ක්‍රමය—ගාල්ල

10—39

ගාලු දිස්ත්‍රික්කයේ බටදූවේ සාදා ඇති කුලියට දීන් නවීමේ ක්‍රමයට දියහැකි අඩු කුලී ගෙවල් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලංකාවේ පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

(අ) තමන්ගේ සහ තමන්ගේ භායඝාව/පුරුෂයාගේ සම්පූර්ණ මාසික ආදායම රුපියල් 200ට නොවැඩි අය;

(ආ) නිවාස යෝජනා ක්‍රමයේ සිට සැතපුම් 5ක අර්ධ විෂ්කම්භයක් තුළ සථිරව පදිංචි හෝ රැකියාවෙහි නියුතු, තමන්ගේ නමින් හෝ තමන්ගේ භායඝාවගේ/පුරුෂයාගේ නමින් හෝ තමන් ගෙන් යැපෙන ළමයෙකුගේ නමින් හෝ ගෙයක් නොමැති අය.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 15ක් පමණ වූ ඉඩමකය. ගෙවල් වල වහළ උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ. බීම පිණිස ජලය ළිං වලින් ලබාගත හැකි අතර නෑම පිණිස ගෙවල් කට්ටියකට එක බැගින් සුදුසු මධ්‍යස්ථානයන්හි නාන ළිං සැපයනවා ඇත.

3. අවුරුදු 25 කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක කුලිය මස කට රුපියල් 22.50 ක් පමණ වේ.

4. ගෙයි පදිංචිකාරයට ගෙයි නීත්‍යානුකූල අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ශෙෂව තිබෙන මුදල එකවිටම ගෙවා දැමීමත් සමගම ගෙයි නීත්‍යානුකූල අයිතියක් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගියදා සිට ගෙයි පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද වරිපනම් හා වෙනත් ගාස්තු ද ගෙවිය යුතුවේ.

5. ගෙවල්වල පදිංචිය සඳහා සුදුසු අය තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි. මොනම අයථා පෙළඹීමක් ඇති වූව හොත් එයම ඉල්ලුම්කරුවකු නුසුදුස්සකු වීමට කාරණයක් වන්නේ ය. තෝරීම කරනු ලබන්නේ කුසපත් ඇදීමෙන් ය. කුසපත් ඇදීමේ දිනය සහ ස්ථානය පුවත් පත් නිවේදනයකින් පසුව දන්වනු ලැබේ. කුසපත් ඇදීම ඉල්ලුම්කරුවන්ට නැරඹිය හැක.

6. කොළඹ ජාතික නිවාස දෙපාර්තමේන්තුව මේ සඳහා පිළියෙල කර ඇති ඉල්ලුම් පත්‍ර මගින් ඉල්ලුම් කළ යුතු අතර එකී ඉල්ලුම් පත්‍ර 1960 නොවැම්බර් මස 18 වැනි දිනට හෝ ඊට පෙර ජාතික නිවාස කොමසාරිස් තැන වෙත ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම් පත එවා දින 21 ක් තුළදී එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණහොත් ඒ බැව් දන්වා තැපැල් කායඝාලයයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. ඉල්ලුම් පත් බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ "බටදූව ගෙවල් සඳහා ඉල්ලුම් පත්" යැයි සඳහන් කළ යුතුය.

කේ. එම්. ඩී. ජයනෙත්ති.
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැප. පෙ. 544, කොළඹ 2.

10-397

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.